www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ වැඩ වර්ජක වතු කම්කරුවන්ට සමාජවාදී ඉදිරිදර්ශනයක්

## A socialist perspective for striking Sri Lankan plantation workers

**සමාජවාදී සමානතා පක්ෂය (ශ්‍රී ලංකාව)**
**2006 දෙසැම්බර් 5**

ශ්‍රී ලංකාවේ තේ හා රබර් වතුවල කම්කරුවන් සිය දෛනික වැටුප රුපියල් 300ක් දක්වා වැඩි කරන ලෙස ඉල්ලමින් අද අඛන්ඩ වැඩ වර්ජනයකට එලඹීමට නියමිත ය. ඔවුන් මෙම වර්ජනය අරඹන්නේ සති දෙකක් තිස්සේ "හෙමින් වැඩ කිරීමේ" ව්‍යාපාරයක් සහ නුවරඑලිය, තලවාකැලේ, බොගවන්තලාව වැනි නගරවල හා වතු තුලමත් විරෝධතා පෙලපාලි මාලාවක් පැවැත්වීමෙන් අනතුරුව ය.

වැටුප් වැඩි වීමක් සඳහා වූ උද්ඝෝෂනයක් හුදු වතු හිමියන්ට හා කලමනාකරුවන්ට එරෙහිව පමනක් නොව ආන්ඩුවට එරෙහිව යන අරගලයක් ඉල්ලා සිටින බව සමාජවාදී සමානතා පක්ෂය (සසප) අනතුරු අඟවා සිටී. වැටුප්, සේවා කොන්දේසි හා රැකියා පිලිබඳව කම්කරුවන්ගේ වැඩෙන විරෝධතාවන්ට ජනාධිපති මහින්ද රාජපක්ෂගේ ප්‍රතිචාරය වී ඇත්තේ, වාර්ගික භේදයන් ඇවිලවීම, දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානයට එරෙහි යුද්ධය උත්සන්න කිරීම සහ කම්කරුවන් එහි බර දරා ගත යුතු යැයි ඉල්ලා සිටීම ය.

වැඩි වැටුප් හා හොඳ සේවා කොන්දේසි වෙනුවෙන් ගෙන යන සටනේ දී, කම්කරුවෝ යුද්ධය හා ව්‍යාපාරිකයන්ගේ ලාභ සඳහා "කැප කරන" ලෙස කෙරෙන ඉල්ලීම් ප්‍රතික්ෂේප කල යුත්තාහ. සිය පොදු පන්ති අවශ්‍යතා වෙනුවෙන් සටන් කිරීම සඳහා ඒකාබද්ධ වී ඇති සිංහල හා දෙමල වතු කම්කරුවන් වැටුප් හා සේවා කොන්දේසි පිරිහීමේ සමාන ගැටලුවලට මුහුන පා සිටින සෙසු කාර්මික කම්කරුවන් දෙසට හැරිය යුතු ය. සමාජවාදී පිලිවෙත් මත පදනම් වූ ඒකාබද්ධ අරගලයක් ඒ සඳහා අවශ්‍ය ය.

වෘත්තීය සමිති නායකයන් එවන් ඉදිරිදර්ශනයකට දැඩි ලෙස විරුද්ධ ය. ප්‍රධාන වතු සමිති දෙක වන ලංකා කම්කරු කොංග්‍රසය (සීඩබ්ලිව්සී) සහ කඳුරට ජනතා පෙරමුන (යූපීඑෆ්), දේශපාලන පක්ෂ ලෙස ද ක්‍රියාත්මක වන අතර ඔවුන් රාජපක්ෂගේ සභාග ආන්ඩුවේ කොටස්කරුවන් ය. සීඩබ්ලිව්සී නායක ආරුමුගම් තොන්ඩමන් සහ යූපීඑෆ් නායක පෙරියසාමි චන්ද්‍රසේකරන්, වර්ගවාදී යුද්ධයක් ගෙන යන හා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල අන කර ඇති ප්‍රතිව්‍යුහකරන පිලිවෙත් ක්‍රියාවට දමන ආන්ඩුවක කැබිනට් අමාත්‍යවරු වෙති.

ආරම්භයේ පටන් ම යූපීඑෆ් හා සීඩබ්ලිව්සී සංවිධානවල එල්ලය වූයේ වැටුප් උද්ඝෝෂනය සීමා කිරීමට හා එමගින් එය රාජපක්ෂ ආන්ඩුව සමග දේශපාලන ගැටුමක් බවට පත් වීම වලකා ගැනීම ය.

පෙර පැවති වසර දෙකක වැටුප් ගිවිසුම ජූනි මස දී අහෝසි විය. 2004 දී සියලු ම වතු වෘත්තීය සමිති දෛනික වැටුප යන්තම් රුපියල් 135කට හා එයට එකතු වන රුපියල් 60ක දීමනාවකට සීමා කල ගිවිසුමකට අත්සන් කලේ ය. එම දීමනාව පැමිනීමට, වැඩ ප්‍රමානයට හා නිෂ්පාදන මිල ගනන්වලට ගැට ගසා තිබුනේ බොහෝ කම්කරුවන්ට ඔවුන්ට වැඩ කිරීමට හැකි වූ දිනවලට පවා රුපියල් 195ක එම මුලු වැටුප නොලැබෙන පරිදි ය.

සීඩබ්ලිව්සී, ලංකා ජාතික වතු කම්කරු සංගමය සහ තවත් කුඩා වෘත්තීය සමිති සමග එක්ව පසු ගිය සිකුරාදා උද්ඝෝෂනයෙන් ඉවත් වීම මගින්. දැනටමත් ඒකාබද්ධ වැඩ වර්ජනයක් කඩාකප්පල් කර ඇත. සීඩබ්ලිව්සී නායක තොන්ඩමන් ප්‍රවෘත්ති සාකච්ඡාවක් අමතමින් තම සමිතිය දැනටමත් සිය ඉල්ලීම රුපියල් 270ක් දක්වා පහත හෙලා ඇතැයි පැවසූ අතර හාම්පුතුන් සමග කෙරෙන සාකච්ඡාවල දී තව දුරටත් සම්මුතිවාදී වීමට පවත්නා සිය කැමැත්ත ද පෙන්නුම් කලේ ය.

සීඩබ්ලිව්සී මන්ත්‍රී වී. පුත්‍රසිගාමනි කෙලින්ම ප්‍රකාශ කලේ සිය සමිතිය සමිති සාමාජිකයන්ගේ පිරිහෙන ජීවන මට්ටම්වලට වඩා කර්මාන්තයේ ද්‍රවශීලිත්වය, එනම් සමාගම්වල ලාභය ගැන උත්සුක වන බව යි. ඔහු මෙසේ පවසමින් වතු ක්ෂේත්‍රයේ මනා ක්‍රියාකාරිත්වය "කඩාකප්පල් කරන" වර්ජනයට එරෙහිව රැලි විය: "අප සිතන්නේ කර්මාන්තයේ තිරසර පැවැත්ම කම්කරුවන්ගේ පැවැත්ම සඳහා අත්‍යවශ්‍ය බව යි."

කම්කරුවන්ගේ අසනහකාරී තත්වය හා වෛරය ගැන හොඳන් දැනුවත් යූපීඑෆ්, කම්කරු විමුක්ති පෙරමුන හා තවත් වෘත්තීය සමිති කිහිපයක් දිගට ම

වර්ජනයේ නියුතුව සිටී. එහෙත් මෙම සමිති ද, සීඩබ්ලිව්සී මෙන් ම, හාම්පුතුන් සමග එකඟතාවකට පැමිනීමේ කැමැත්ත දැනටමත් පල කර තිබේ. තම සමිති නායකයන් සාධාරන ගිවිසුමක් ඇති කර ගනු පිනිස ජනාධිපති රාජපක්ෂගේ සහාය ලබා ගැනීමට උත්සාහ කරන බව යූපීඑෆ් නායක චන්ද්‍රසේකරන් නිවේදනය කලේ ය.

කෙසේ වෙතත්, මොන යම් හෝ වැටුප් වැඩිවීමකට තමන් විරුද්ධ බව රාජපක්ෂ දැනටමත් පැහැදිලි කර ඇත. "අයිතීන්" ගැන කතා කිරීමට පෙර ඔවුන් තම " වගකීම්" ඉටු කල යුතු යැයි ඔහු කම්කරුවන්ට අනතුරු අඟවා ඇත. සති තුනකට පෙර, රාජ්‍ය අංශයේ කම්කරුවන්ට කිසිදු සැලකිය යුතු වැටුප් වැඩිවීමක් ප්‍රතික්ෂේප කල අයවැයක් ජනාධිපති විසින් ඉදිරිපත් කරන ලදි. පුද්ගලික හා රාජ්‍ය අංශයේ කාර්මික ක්‍රියාවන් තහනම් කිරීමේ අයිතිය ඔහුට ලබා දෙන අත්‍යවශ්‍ය සේවා විධිවිධාන ඔහු දැනටමත් බලාත්මක කර ඇත.

ඔවුන් වසර ගනනාවක් තිස්සේ කලාක් මෙන්, සීඩබ්ලිව්සී හා යූපීඑෆ් කම්කරුවන් රැවටීමේ පරන සෙල්ලමේ ම යෙදී සිටී. මෙම සමිති දෙක එක් ආන්ඩුවකින් පසුව අනෙක් ආන්ඩුවට අවස්ථාවාදී ලෙස එකතු වී ඇත්තේ, රටේ 500,000ක් පමන වන වතු කම්කරුවන්ට එමගින් යහපතක් උදා වනු ඇතැයි කියාපාමිනි. ඒ වෙනුවට, වැටුප් හා සේවා කොන්දේසි පිරිහීමට ලක්ව හා රැකියා විනාශ කෙරී ඇති තතු යටතේ පවා. මොන යම් හෝ ස්වාධීන අරගලයක් වැලකීමේ හා මැඩලීමේ ප්‍රධාන ක්‍රියාකලාපය සීඩබ්ලිව්සී හා යූපීඑෆ් සමිති විසින් සිදු කරනු ලැබ ඇත.

වතු කම්කරුවෝ ශ්‍රී ලංකාවේ කම්කරු පන්තියේ වඩාත්ම අඩු වැටුප් ලබන හා වඩාත්ම පීඩිත කොටස් අතරට වැටෙති. ඔවුන් ජීවත් වන්නේ, බැරැක්ක ආකාරයේ නිවාසවල සිට අධ්‍යාපන හා සෞඛ්‍ය සේවා සැපයුම දක්වා සිය ජීවිතයේ සෑම දෙයක්ම වතුකරය වටා කැරකෙන සම-ප්‍රවේනි දාස තත්වයක ය. කම්කරුවන්ගේ ජීවන මට්ටම් තව දුරටත් බාදනය කිරීම මගින් තේ හා රබර් වතුකරයේ "තිරසර භාවය" පවත්වා ගෙන යාමට වෘත්තීය සමිති ආන්ඩුව හා හාම්පුතුන් සමග සහයෝගීව ක්‍රියා කර ඇත.

කෘෂිකාර්මික කම්කරුවන්ගේ මූර්ත වැටුප් දර්ශකය 2003 දී 98ක් වූ අතර එය 2005 මුල දී 90.2 දක්වා පහත වැටුනු අතර 2005 දෙසැම්බර් වන විට 86.2 දක්වා පල්ලම් බැස්සේ ය. යුද්ධය හා නැගෙන ඉන්ධන මිල ගනන් හේතු කොට ගෙන මේ වසරේ උද්ධමනය සියයට 12 දක්වා තියුනු ලෙස ඉහල නැගීමත් සමග, වතු කම්කරුවන්ගේ මූර්ත වැටුප් තව දුරටත් පහල වැටෙනු ඇත. ප්‍රපාතයට වැටීමට ආසන්නයේ සිටින වතු කම්කරුවන්ට, ඉහල යන විරැකියාව සමග වැටුප් තව දුරටත් බාදනය වීම ව්‍යසනයක් බවට පත්ව ඇත.

පසු ගිය වසරේ තිබූ රුපියල් බිලියන 67 සිට මේ ඔක්තෝබර් වන විට රුපියල් බිලියන 75 දක්වා සිය අපනයන ඉහල දමා ගෙන සිටින වතු සමාගම් අනිවාර්‍යයෙන් ප්‍රතිචාර දක්වන්නේ ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත "ජාත්‍යන්තරව තරගකාරී" විය යුතු යැයි පවසමිනි. ශ්‍රී ලංකාවේ තේවලට ලෝක වෙලඳ පොලේ පැවති ප්‍රමුඛ තත්වය දැනටමත් කෙන්යාව හමුවේ අහිමි වී ඇතැයි ආන්ඩුව හා හාම්පුත්තු අනතුරු අඟවති. ඉතින් වෘත්තීය සමිති වහාම ඒ අනුව හැඩගැසී ඇත.

වතු කම්කරුවන් තමන්ගේ ම ජාත්‍යන්තර මූලෝපායක් සකසා ගත යුතු යඃ ශිෂ්ඨ සම්පන්න වැටුප් හා ජීවන මට්ටම් සඳහා ඒකාබද්ධ අරගලයක් අරඹනු වස් චීනයේ, ඉන්දියාවේ හා අප්‍රිකාවේ වතු කම්කරුවන් වෙත හැරිය යුතු ය.

සීඩබ්ලිව්සී, යූපීඑෆ් හා සෙසු වෘත්තීය සමිති විසින් ගෙන යනු ලබන ප්‍රෝඩාකාරී ව්‍යාපාරය ප්‍රතික්ෂේප කොට පහත ඉල්ලීම් සඳහා පුලුල් අරගලයක් ආරම්භ කරන ලෙස සමාජවාදී සමානතා පක්ෂය කම්කරුවන්ට කැඳවුම් කර සිටීඃ

* දෛනික වැටුප් ක්‍රමය අවසන් කරනු. පැය 40ක වැඩ සතියක් වෙනුවෙන්, උද්ධමනය සමග ස්වයංක්‍රීයව ඉහල යන පරිදි සැකසුනු, අඩු ගනනේ රුපියල් 15,000ක මාසික වැටුපක් වතු කම්කරුවන්ට සහතික කල යුතු ය. අසනීප නිවාඩු, විශ්‍රාම වැටුප් සහ අතිකාල වැඩ සඳහා අමතර ගෙවීම් ඇති කර ගැනෙන ගිවිසුමකට ඇතුලු විය යුතු ය.

* මනා නිවාස, අධ්‍යාපනය හා සෞඛ්‍ය සේවා. වතු කම්කරුවන්ගේ කාලකන්නි මට්ටමේ නිවාසවල තත්වය වැඩි දියුනු කල යුතුය, නැතිනම් නල ජලය හා විදුලි බලය වැනි අත්‍යවශ්‍ය පහසුකම් සහිත නව නිවාස මගින් ඒවා මුලුමනින් ම විස්ථාපනය කල යුතු ය. ශිෂ්ඨ සම්පන්න ජීවන කොන්දේසි සඳහා කෙරෙන ඉල්ලීම, ධනවත් අතලොස්සකගේ ලාභ අවශ්‍යතා වෙනුවට බහුතරයේ අවශ්‍යතා මත පදනම් වන පරිදි සමාජය සමස්ථයක් වසයෙන් යලි සැකසීමේ සමාජවාදී වැඩපිලිවෙලක කොටසක් විය යුතු ය.

* යුද්ධයට එරෙහිව වනු, ප්‍රජාතන්ත්‍ර අයිතීන් ආරක්ෂා කරනු. කම්කරුවන් එකිනෙකාගෙන් භේද කිරීමේ විධි ක්‍රමයක් ලෙස රාජපක්ෂ ආන්ඩුව හිතාමතාම වාර්ගික වෛරය අවුලුවා යුද්ධය උත්සන්න කර තිබේ. වර්ගවාදී යුද්ධයට තවත් එක් මිනිසෙකු, තවත් එක රුපියලක් නොදෙනු යැයි අපි කියා සිටිමු. සියලු ම රූපාකාරයේ ජාතිකවාදයන් හා වර්ගවාදයන් ප්‍රතික්ෂේප කරන ලෙස කැඳවුම් කර සිටින සසප උතුරෙන් හා නැගෙනහිරෙන් සියලු ආරක්ෂක හමුදාවන් වහාම හා කොන්දේසි විරහිතව ඉවත් කරන ලෙස ඉල්ලා සිටී.

දකුනු ආසියාවේ හා ජාත්‍යන්තරව සමාජවාදී සමූහාන්ඩු සංගමයක් සඳහා වූ වඩා පුලුල් අරගලයක

කොටසක් ලෙස ශ්‍රී ලංකා-ඊලම් සමාජවාදී සමූහාන්ඩුවක් සඳහා සටන් වැදීමට කම්කරු පන්තියේ -- සිංහල, දෙමල හා මුස්ලිම් -- ඒකාබද්ධ අරගලයක් අවශ්‍ය ය.

මෙම වැඩපිලිවෙල බැරෑරුම්ව සලකා බලන ලෙසත් සසප හා ලොව වටා එහි සහෝදර පක්ෂ විසින් පල කරනු ලබන *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* නිතිපතා කියවන ලෙසත් අපි වතු කම්කරුවන්ගෙන් ඉල්ලා සිටිමු. අන් සියල්ලටමත් වඩා අප වැඩ කරන ජනතාවගෙන් හා තරුනයන්ගෙන් ඉල්ලා සිටින්නේ සසපට බැඳී මෙම ඉදිරිදර්ශනය සඳහා සටන් වැදීමට අවශ්‍ය වන කම්කරු පන්තියේ මහජන පක්ෂය ලෙස සසප ගොඩනැගීමට එක් වන ලෙස යි.

© www.wsws.org